විශ්‍රාම වැටුප් චක්‍රලේඛ : 10/2020

මගේඅංකය: විවැ/චක්‍රලේඛ/2020

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,

මාළිගාවත්ත,

කොළඹ 10.

2020.12.18

දිස්ත්‍රික් ලේකම්වරුන්,

ප්‍රාදේශීය ලේකම්වරුන්,

සියළුම රාජ්‍ය හා පෞද්ගලික බැංකු සභාපතිවරුන්,

ප්‍රධාන විධායක නිලධාරීන්.

<u>පරිපූරක උත්සව ණය යෝජනා ක්‍රමය</u>

ජනාධිපති ලේකම්ගේ 2020.12.15 දිනැති ලිපියෙන් ලබා දී ඇති උපදෙස් පරිදි, නත්තල් හා නව වසර උදාවත් සමඟ එළඹෙන උත්සව සමය වෙනුවෙන් විශ්‍රාමිකයින්ගේ විවිධ අවශ්‍යතා සපුරා ගැනීමට සෑම පවුලක්ම ආවරණය වන පරිදි පරිපූරක මූල්‍ය පහසුකම් ලබා දීම සඳහා ණය මුදලක් පහත පරිදි ප්‍රදානය කරනු ලැබේ.

(අ) මසකට රු.50,000 ක් හෝ ඊට වැඩි විශ්‍රාම වැටුප් ලබන විශ්‍රාමිකයින්ට රු.50,000 ක ණය මුදලක්

(ආ) මසකට රු.25,000 කට වැඩි නමුත් රු.50,000 කට අඩු විශ්‍රාම වැටුප් ලබන විශ්‍රාමිකයින්ට රු.25,000 ක ණය මුදලක්

(ඇ) මසකට රු.25,000 කට අඩු විශ්‍රාම වැටුප් ලබන විශ්‍රාමිකයින්ට රු.10,000 ක ණය මුදලක්

02. ඉහත සඳහන් ආදායම් සීමාවන්ට යටත්ව එක් විශ්‍රාමිකයෙකුට තම ජාතික හැඳුනුම්පත් අංකය මත පදනම්ව එක් පරිපූරක උත්සව අත්තිකාරම් ණය මුදලක් පමණක් නිදහස් කළ යුතුය.

03. විශ්‍රාමිකයින් විසින් තම විශ්‍රාමික හැඳුනුම්පත හෝ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කර තම විශ්‍රාම වැටුප ලබා ගන්නා බැංකුව මඟින් මෙම ණය පහසුකම සඳහා ඉල්ලීම් කළ හැක.

04. සක්‍රීය විශ්‍රාමිකයකු බව සහතික කරගැනීම සඳහා දැනටමත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් ඔබ වෙත ලබාදී ඇති තොරතුරු තාක්ෂණ පහසුකම් භාවිතා කල යුතු අතර ණය ලබාදීමෙන් පසු අදාල විස්තර එම පද්ධතිය තුල යාවත්කාලීන කල යුතුය.

05. පවතින වසංගත අවධානම තුළ වැඩිහිටි විශ්‍රාමික ප්‍රජාව කිසිඳු අයුරකින් අපහසුතාවයට පත් නොකර ඉතා කඩිනමින් එම සේවාවන් ලබා දීම කල යුතු බව කාරුණිකව දන්වමි.

06. මෙම චක්‍රලේඛය රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ එකඟතාවය මත නිකුත් කරන ලදි.

ජ්.ජගත් ඩී ඩයස්

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:

| | | |
|---|---|---|
| 1. | ජනාධිපති ලේකම් | - කරු.දැ.ගැ.ස |
| 2. | අග්‍රාමාත්‍ය ලේකම් | - කරු.දැ.ගැ.ස |
| 3. | අමාත්‍ය මණ්ඩල ලේකම් | - කරු.දැ.ගැ.ස |
| 4. | ලේකම්,රාජ්‍ය සේවා,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | - කරු.දැ.ගැ.ස |
| 5. | ලේකම්, මුදල් අමාත්‍යාංශය | - කරු.දැ.ගැ.ස |
| 6. | විගණකාධිපති | - කරු.දැ.ගැ.ස හා අ.ක.ස |